ගණිතය - I, II
Mathematics - I, II

කාලය පැය 02

නම :- ............................................ විභාග අංකය :-

9 ශ්‍රේණිය

# I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) 7, 9, 11, 13, .................සංඛ්‍යා රටාවේ පොදු පදය ලියන්න.

(02) $T_n = 2n - 1$ පොදු පදය වූ සංඛ්‍යා රටාවේ 20 වන පදය සොයන්න.

(03) 51 ද්විමය සංඛ්‍යාවක් ලෙස ලියන්න.

(04) $1101_{දෙක} + 111_{දෙක}$ අගය සොයන්න.

(05) $110011_{දෙක} - 10001_{දෙක}$ අගය සොයන්න.

(06) මුදලකින් $\frac{1}{5}$ ක් රු. 300 නම් මුළු මුදල සොයන්න.

(අනෙක් පිටුව බලන්න.)

(07) භාණ්ඩයක් ගත් මිළ රු. 900 ක් වේ. 5% ක ලාභයක් ලැබීම සඳහා ලකුණු කළයුතු මිළ සොයන්න.

---

(08) රු. 1500 ට මිළ ලකුණු කරන ලද භාණ්ඩයක් විකිණීමේ දී 10% ක වට්ටමක් ලබා දේ වට්ටම දුන් පසු වටිනාකම සොයන්න.

---

(09) සෘජුකෝණාස්‍රයක දිග එහි පළලෙහි දෙගුණයකට වඩා 3 cm ක් වැඩිවේ. එහි වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියන්න.

---

(10) $\left(\frac{1}{5} + \frac{3}{10}\right)$ න් $\frac{1}{5}$ හි අගය සොයන්න.

---

(11) $x^2 + 10x - 4x - 20$ හි සාධක සොයන්න.

---

(12) $1 - 100y^2$ හි සාධක සොයන්න.


---

(13) 1 kg න් $\frac{1}{5}$ ක් කීයද?

---


(14) $m = -\frac{1}{2}$ නම් $5-8m$ හි අගය කීයද?

(අනෙක් පිටුව බලන්න.)

(15) 


$x$ හා y අගයන් සොයන්න.

---

(16) 


$a$ හා b අගයන් සොයන්න.

---

(17) $(x - 2)(x + 3)$ සුළු කරන්න.

---

(18) රු. 3000 000 ක් වටිනා වාහනයක් විකිණීමේ දී තැරැව්කරුට රු. 60 000 ක් ලබාදේ නම් කොමිස් ප්‍රතිශතය සොයන්න.

---

(19) 10 cm ක් දිග 8 cm ක් පළල ද 5 cm උස වූ භාජනයක පරිමාව ml වලින් සොයන්න.

---

(20) 1 ත් 50 ත් අතර ත්‍රිකෝණ සංඛ්‍යාවක් හා වර්ග සංඛ්‍යාවක් වන සංඛ්‍යාව කුමක් ද?

(ලකුණු 2 x 20 = 40)

(අනෙක් පිටුව බලන්න.)

## II කොටස

- ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a)

(i) $1\frac{2}{7}$ න් $\left(2\frac{2}{3} - 1\frac{1}{2}\right)$ (ii) $\frac{2}{3} \times \frac{3}{5} + 1\frac{1}{10}$

(b) මිනිසෙකු තමා සතු මුදලින් $\frac{1}{3}$ ක් බිරිඳට ද ඉතිරියෙන් $\frac{1}{2}$ ක් තම දරුවන් දෙදෙනා අතර සමසේ බෙදා දෙන ලදී. ඉතිරි මුදලින් $\frac{1}{4}$ ක් පුණ්‍ය ආයතනයකට දෙන ලදී.

I. එක දරුවෙකුට ලැබුණු මුදල මුළු මුදලින් කොපමණද? (ලකුණු 02)
II. පුණ්‍ය ආයතනයට ලබා දුන් මුදල මුළු මුදලින් කොපමණද? (ලකුණු 02)
III. පුණ්‍ය ආයතනයට ලබාදුන් මුදල රු. 10 000 ක් නම් මුළු මුදල සොයන්න. (ලකුණු 02)

---

(02) (a)

I.
○ ○    ○ ○ ○    ○ ○ ○ ○
○ ○    ○ ○ ○    ○ ○ ○ ○    ------------------------

මෙම රටාවේ හතරවන රටාව ඇඳ පෙන්වන්න. (ලකුණු 01)


II. මෙහි පොදු පදය සොයන්න. (ලකුණු 03)

(b) $T_n = 5 - 2n$ පොදු පදය වූ සංඛ්‍යා රටාවේ,

I. 20 වන පදය සොයන්න. (ලකුණු 02)
II. -45 වන්නේ කීවෙනි පදය ද? (ලකුණු 02)
III. n + 1 වැනි පදය සොයන්න. (ලකුණු 02)

---

(03) (a)





මෙහි ධාරිතාවය ml වලින් සොයන්න. (ලකුණු 02)

(b) ජල ටැංකියක දිග 10 m ක් ද පළල 8 m ක් ද උස 4 m ක් ද වේ.


I. මෙම ටැංකියේ ධාරිතාවය $l$ වලින් සොයන්න. (ලකුණු 02)
II. මෙම ටැංකියේ 1.5 m ක් උසට ජලය පුරවා තිබේ නම් එහි අඩංගු ජල පරිමාව ලීටර කීයද? (ලකුණු 02)
III. මෙම ටැංකිය සම්පූර්ණයෙන් ම පිරවීමට තව කොපමණ ජලය ප්‍රමාණයක් අවශ්‍ය වේද? (ලකුණු 01)
IV. මෙම පිරී ඇති ජල පරිමාව පතුලේ වර්ගඵලය 60 $m^2$ ක් වූ ඝනකාභාකාර ටැංකියකට දැමූ විට කොපමණ උසකට ජලය පිරේද? (ලකුණු 03)

(04)





හා y අගයන් සොයන්න.

**(ලකුණු 02)**




P හා q අගයන් සොයන්න.

**(ලකුණු 02)**




දී ඇති තොරතුරු අනුව $a$ හා b අගයන් සොයන්න.

BD // AC සහ

AB // DC බව පෙන්වන්න.

**(ලකුණු 06)**

---

(05) (a) $x$ = -2 හා y = 3 විට පහත ප්‍රකාශන වල අගය සොයන්න.

(i) $2x - 3y$ **(ලකුණු 02)** (ii) $\frac{x}{2} - \frac{y}{3}$ **(ලකුණු 02)**

(b) සාධක සොයන්න.

(i) $x^2 - 7x + 6$ **(ලකුණු 02)** (ii) $6x^2 + 2y^2 - 4xy - 3xy$ **(ලකුණු 02)**

(iii) සාධක භාවිතයෙන් අගය සොයන්න.

**(ලකුණු 02)**

$103^2 - 3^2$

---

(06) (a) වෙළෙන්දෙක් එක්තරා භාණ්ඩයක් **15%** ක ලාභයක් තබාගෙන රු. **6440**කට මිළ ලකුණු කරයි. එහි ගත් මිළ සොයන්න. **(ලකුණු 02)**

(b)

| A පොත්හල | B පොත්හල |
|---|---|
| සෑම මිළදී ගැනීමකටම **10%** ක වට්ටමක් | රුග **2000**ට වැඩි ඕනෑම බිල්පතක් සඳහා රු. **200** ක මිළ අඩුකිරීමක්. |

I. හිමාලි A වෙළඳසැලට ගොස් රු. **3000** ක් වටිනා පොත් මිළදී ගනී. ඇය ගෙවිය යුතු මුදල සොයන්න. **(ලකුණු 02)**


II. අචිනි B වෙළඳසැලට ගොස් රු. **2500** ක් වටිනා පොත් මිළදී ගත්විට ඇය ගෙවිය යුතු මුදල කීයද? **(ලකුණු 02)**

III. අචිනි එම පොත් A වෙළඳ සැලෙන් ගත්තේ නම් ගෙවිය යුතු මුදල සොයන්න. **(ලකුණු 02)**

IV. අචිනිගේ මිළදී ගැනීම සඳහා වඩා වාසි දායක වන්නේ කවර වෙළඳ සැලද? **(ලකුණු 02)**

(අනෙක් පිටුව බලන්න.)

(07) (a)




රූපයේ පරිදි

ABCD සෘජුකෝණාස්‍රාකාර ආස්තරයෙන් අඳුරු කර ඇති කොටස් ඉවත් කරන ලදී.

I. ABCD සෘජුකෝණාස්‍රාකාර ආස්තරයේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියා එය ප්‍රසාරණය කර ලියන්න. **(ලකුණු 02)**

II. වෙන් කරන ලද කොටසේ වර්ගඵලය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියා ප්‍රසාරණය කරන්න. **(ලකුණු 02)**

III. ඉතිරි කොටසේ වර්ගඵලය සඳහා වීජීය ප්‍රකාශනයක් ලබාගන්න. **(ලකුණු 02)**

(b) වරහන් ඉවත්කර සුළු කරන්න.

(i) $(x-3)(x-2)$

**(ලකුණු 02)**

(ii) $(2x+1)(x-3)$

**(ලකුණු 02)**

MATHS PAPERS.INFO



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න